دار زايد للثقافة الإسلامية
Zayed House For Islamic Culture

# සායිද්
# මානවවාදී දිනය



يوم زايد للعمل الإنساني
حب ووفاء .. لزايد العطاء

## සායිද් මානවවාදී දිනය

සෑම වසරකම රමඩාන මාසයේ 19වන දින, එක්සත් අරාබි එමීර් රාජ්‍යය විසින් "සායිද් මානවවාදී දිනය" සංවත්සරය සමරණු ලබයි. මෙදින ජාතියේ පියා වන ෂෙයික් සායිද් ඉබ්නු සුල්තාන් අල්-නහ්යාන් (දෙවියන් ඔහුගේ ආත්මය ආරක්ෂා කරත්වා) තුමාගේ අභාවය සිදුවූ දිනය වේ. මෙම කාලසීමාව තුල, එක්සත් අරාබි එමීර් රාජ්‍යය විසින් මානවවාදී යෝජනාක්‍රම ක්‍රියාවට නංවනු ලබයි. තවද, විවිධ උත්සව සහ ක්‍රියාකාරකම් දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් පුණ්‍යාධාර ලෙස ක් රියාත්මක කරනු ලබයි. සියලු ක්‍රියාකාරකම්වලට අනුග්‍රහය සපයනු ලබන්නේ එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ප්‍රජා ආයතනයන්ය. පරිත්‍යාගය සහ පුනරුත්ථාපනය යන සායිද් උරුමයන් ගෙන් එය සමන්විත වේ.

## සායිද් මානවවාදී දිනයේ අරමුණු සහ ක්‍රියාකාරකම්:

වාර්ෂිකව රමඩාන් මාසයේ සායිද් මානවවාදී දිනය සමරණු ලබන අතර එය සායිද් තුමාගේ අගනා මෙහෙවර වන සමාජීය සහ මානව හිතකාමී සාරධර්ම පිළිබිඹු වන ආකාරයෙන් පවත්වනු ලබයි.

## සුවිශේෂී අරමුණු:-

1- ජාතියේ පළමු නායකායා වන ෂෙයික් සායිද් තුමා අනුස්මරණය කිරීම.
2- මානවවාදී මූලධර්මයන් අවධාරණය කිරීම සහ එහි වැදගත්ම සංවර්ධනය පිළිබඳ මානව ප්‍රජාවට අවධාරණ කිරීම.
3- ගෝලීය මනුෂ්‍ය වර්ගයාට සහන සැලසීම. විශේෂයෙන් දුප්පත් සහ අමාරුකම්වලින් පෙළෙන අයට.
4- දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් මානවවාදී ව්‍යාපෘති සඳහා පළමු පියවර තැබීමට උපකාර වීම.
5- ජාත්‍යන්තර වශයෙන් මානවවාදී ව්‍යාපෘති සඳහා අනුබල දීමෙන් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ප් රතිරූපය උසස් කරගැනීම.

මේ අනුව, මානවවාදී කටයුතු වලට අදාළ නිර්මාණශීලිත්වය සහ විවිධත්වය සඳහා වේදිකාවක් ලෙස "සායිද් මානවවාදී දිනය" සංකේතයක් වේ. සැලකිය යුතු කරුණක් ලෙස සමාජයක් විසින් කරනු ලබන යහපත් ක්‍රියාවන්වලට දිරිගැන්වීම හා අනුබල දීමක් මෙයින් කරනු ලැබේ. රාජ්‍ය සහ පුද්ගලික ආයතනයන්ගේ අනුග්‍රහයෙන් නව ක්‍රියාකරකම් සහ ව්‍යාපෘති ආරම්භ කිරීම මගින් සියලු මානව හිතවාදී අංශයන්ගෙන් මනුෂ්‍ය සහ සංස්කෘතික ලක්ෂණ ලෝකයාට විදහාපානු ලබයි.

## සායිද් මානව හිතවාදී කටයුතුවලට උදාහරණයක් ලෙස:

අපවත් වූ ෂෙයික් සායිද් දේශීය, කලාපීය සහ ජාත්‍යන්තර වශයෙන් ත්‍යාගශීලී කටයුතුවලට හොඳම උදාහරණයක් වෙයි. ඔහුගේ අභාවයෙන් පසු මාවත්, රෝහල්, අභස් පාලම් සහ පාසැල්, ඔහුගේ නමින් නම් කිරීම මගින් ඔහුගේ සමාජයට සිදුවූ මෙහෙවර සිහිපත් වේ. ඔහුගේ ප්‍රඥා සම්පත්තිය මෙසේ ඉතිහාසගත වී ඇත "අපි විශ්වාස කරන දෙය නම්, දෙවියන් වහන්සේ අපට ලබා දුන් ධනයෙන් ලැබෙන යහපත, අප අපගේ මිතුරන් හා සහෝදරයන් වෙත ළඟා විය යුතුය". මේ පදනම මත ෂෙයික් සායිද් තුමාගේ නියෝගයන් ස්ථාවර මූලධර්මවලින් යුක්ත වූ, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ දර්ශනයට ආවේණික ආගම හෝ ජාතීන් නොසලකා මානුෂික මුහුණුවරකින් යුක්ත වූ ප්‍රතිපත්තිවලට අනුකූල ව්‍යාපෘතියකි.



## සායිද් පුණ්‍යාධාර ක්‍රියාකාරකම්:-

අබුඩාබි එමිරේටයේ පාලනය ආධිපත්‍යය දැරූ තැන් පටන් ඔහුගේ ත්‍යාගශීලි පෙළඹවීම නොකඩවා පවත්වාගෙන ගියේය. තම ජනතාවට ප්‍රශ්න ඇති වූ විට එයට නිසි පිළියම් යෙදීමට ඉතා උනන්දුවෙන් ක්‍රියා කළේය. එපමණක් නොව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය වරින් වර තම ජනතාවට, බලධාරීන්ට සහ රාජ්‍ය ආයතනවලට මානවවාදී ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා උනන්දු කරන ලෙස ඔහු නියෝග කළේය. ඔහුගේ මානව හිතවාදී බව පහත කියමනෙන් පැහැදිලි වේ. "

"යහපත් අනාගතයක් උදෙසා කර්මාන්තශාලා හා පහසුකම් ලබාදීමට පෙර ජාතිය ගොඩනැගීම ජාතිය අවශ්‍යතාවයකි. මානව වර්ගයා නොමැතිව අනෙක් සියල්ලම අර්ථ විරහිතයි." සත්‍ය වශයෙන්ම, ඔහු නිරන්තරයෙන්ම මානව වර්ගයාගේ යහපත සඳහා පරිත්‍යාග කිරීමට සැදී පැහැදී සිටි කෙනෙකි.

## එක්සත් අරාබි එමීර් රාජ්‍යය සායිද් චින්තනය පිළිපැදීම:

අතිගරු ෂෙයික් කලීෆා බින් අල්- නහ්යාන් (දෙවියන් ඔහුව ආරක්ෂා කරත්වා) මහතාගේ නායකත්වය යටතේ එක්සත් අරාබි එමීර් රාජ්‍යය ෂෙයික් සායිද් බින් සුල්තාන් (දෙවියන් ඔහුගේ ආත්මය ආරක්ෂා කරත්වා) තුමාගේ ප්‍රතිපත්ති අනුගමණය කරයි. ඔහුගේ ප්‍රතිපත්ති සහ සාරධර්ම එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ප්‍රබෝධයේ මූලාශ්‍රයක් ලෙස මානුෂික සංවර්ධනය සහ ත්‍යාගශීලි කාර්යයන් මත පදනම් වී ඇත. තම රට වැසියන්ට මෙන්ම විදේශිකයින්ටද ඔහුගේ උපදේශයන් වලංගුව පවතී.

ආධාර ලබන පුද්ගලයින්ගේ දේශපාලන, ජාතික හෝ ආගමික චින්තන නොසලකා, ඔවුනට උපකාර කරනු ලැබේ. විශේෂයෙන් සැලකිය යුතු කරුණක් වන්නේ, පළමු අංගයක් ලෙස මානුෂික අවශ්‍යතාවය සහ පුද්ගලයින් මුහුණපාන තත්වය සුදුසුකමක් ලෙස සලකනු ලැබීමයි. 2017 වසරේ, ජාත්‍යන්තර ආර්ථික සහයෝගිතා හා සංවර්ධන ආයතනයේ (OECD) වාර්තාවට අනුව, ජාත්‍යන්තර වශයෙන් ආධාර උපකාර කරන රටවල්වලින් එක්සත් අරාබි එමීර් රාජ්‍යය පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව පළමු ස්ථානය දිනාගෙන ඇත.

## එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ මානුෂික ආධාර:-

මානුසික කටයුතුවල වැදගත්කම අවධාරණය කරමින්, 2014 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවට අනුව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය විදේශ සහයෝගිතා ආධාර කාර්යාලය පිහිටුවා ඇත. මෙම කාර්යාලයේ සහාය ඇතිව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ එහි වැසියන් ඔවුන්ගේ සදාචාරාත්මක අවනතභාවය පිළිඹිබු කරමින් ලෝකයේ සිදුවන මානුෂික අවශ්‍යතාවයන් වලට උපකාර කරනු ලබයි.

## එක්සත් අරාබි එමීර් රාජ්‍යය තුල මානුෂික ආධාර:

එක්සත් අරාබි එමීර් රාජ්‍යය ලෝකය පුරා ජනතාවට සේවය කරන දේශීය හා ජාත්‍යන්තර මානුෂීය සංවිධාන ගණනාවක් සඳහා මූලස්ථානයක් ලෙස නම් කළ හැක. මෙම සංවිධාන පහත සඳහන් වේ:

1- සායිද් බින් අල්-නහ්යාන් පුණ්‍යාධාර හා මානුෂික පදනම
2- කලීෆා බින් අල්-නහ්යාන් පුණ්‍යාධාර හා මානුෂික පදනම

3- අල්-මක්තූම් පදනම
4- ඩුබායි දයාව පිළිබඳ ආයතනය
5- එක්සත් අරාබි එමීරයේ රතු අඩසඳ

මෙම ක්ෂේත්රයේ උත්සාහයට අනුව, දයාව පිළිබඳ ආයතන මගින් ලැබෙන දායකත්වය මානුෂික ප්රතිලාභ ලබන පුද්ගලයින්ට ඉතා වැදගත් වෙයි. ක්රියාවට නැංවූ වැඩ පිළිවෙලවල් අතර සංවර්ධන ව්යාපෘති සහ මානුෂික ආධාර සඳහන් කළ හැක.

පොදුවේ ගත් කල "සායිද් මානවවාදී දිනය" ආධාර සැපයීම හා මානුෂික ප්රබෝධයේ සංකේතයක් ලෙස එක්සත් අරාබි එමීර් රාජ්යය ඔවුන්ගේ දායකත්වය තහවුරු කරයි. අපවත්වූ ජාතියේ පියාණන්ගේ උරුමය අඛණ්ඩව කරගෙන යාමට කැපවීමක් ලෙස වාර්ෂික සංවත්සර දිනය සමරණු ලබයි.

دار زايد للثقافة الإسلامية
Zayed House For Islamic Culture

zhic.uae @zhic_uae zhic_uae zhic

800 555 اتصل على JUST CALL

P.O Box: 16090, Al Ain, U.A.E
www.zhic.ae contact@abudhabi.ae

رؤيتنـــــــــا : مؤسسة رائدة في التعريف بجوهر الثقافة الإسلامية واستيعاب المهتدين الجدد

Our vision : A leading organization dedicated to present the essence of the Islamic culture and assimilating new muslims into the society